# රුවන්පුර රුවන්ගෙය - අපේ පොත්ගුල

උත්තලා නයනී
පුස්තකාලයාධිපති
රත්නපුර මහජන පුස්තකාලය

මිනිසා සමගම ප්‍රභවය වී, මිනිසා සමගම ප්‍රගමනය වී, මිනිසාගේ දැනුමින් මිනිසාට ම සේවය ලබාදෙනු ලබන දැනුම් කෝෂ්ඨාගාරයක් වශයෙන් පුස්තකාලය හඳුන්වාදිය හැකිය. විවිධ පුස්තකාල වගර්යන් අතර අද්විතීය සේවාවක් ඉටුකරනු ලබන මහජන පුස්තකාලය යනු, තම ප්‍රජාවට අධ්‍යාපනික, ආථර්ීක, දේශපාලනික, සංස්කෘතික හා විනෝදාත්මක තොරතුරු සපයන බහුවිධ පරමාථර් සහිත ආයතනයකි. දැනුම කරා ගමන් කිරීමේ ප්‍රාෙද්ශීය දොරටුවක් වන මහජන පුස්තකාලය මගින් ජාතිය, ආගම, ජන වගර්ය, වයස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, භාෂාව, ආථර්ීක තත්ත්වය, රැකියා තත්ත්වය, අධ්‍යාපනික පසුබිම ආදී කරුණු සැලකිල්ලට නොගෙන සැමට සමාන ව තොරතුරු හා දැනුම සඳහා ප්‍රවේශය සැපයීම සිදුකරයි.

**රත්නපුර මහජන පුස්තකාලයේ ඉතිහාසය**

අප පුස්තකාලය "කෞතුකාගාර මහජන පුස්තකාලයක්" වශයෙන් හඳුන්වාදීම අසාධාරණ කරුණක් නොවන බව පුස්තකාල ඉතිහාසය හොදින් කියවනනෙකුට අවබෝධ වන කරුණකි. රත්නපුර මහජන පුස්තකාලයේ මූලාරම්භය මෙරට ඉංග්‍රීසි පාලන සමය දක්වා දිවයන්නකි. එනම්, නගර සභා (ලෝකල් බෝඩ්) ඉතිහාසයටත් වඩා ඉපැරණි ය. ආරම්භක යුගයේ දී මෙය මහජන පුස්තකාලයක් නොවීය. ඉංග්‍රීසි පාලන සමයේ, වෂර් 1857 දී මුලින්ම මෙම පුස්තකාලය ආරම්භ කරන ලද අතර එය ඉංග්‍රීසි පාලක පංතියේ ප්‍රයෝජනය සඳහා පමණක් විවෘත වූ පුස්තකාලයක් විය. මෙම පුස්තකාල සේවාව පවත්වාගෙන ගොස් ඇත්තේ “බුක් ක්ලබ් “ නමැති සංවිධානයක් මඟිනි.

“වේස් අනුස්මණ ශාලාව” නමැති ඉංග්‍රීසි පාලන සමයේ ඉදිකරන ලද ගොඩනැගිල්ලක ප්‍රථමයෙන් ම රත්නපුර මහජන පුස්තකාලය පවත්වාගෙන ගොස් ඇත. මෙම වේස් අනුස්මරණ ශාලාව ඉදිකර ඇත්තේ 1880 දශකයේ රත්නපුර උප දිසාපති ධූරයත්, 1889 ජනවාරි 04 වන දින සපරගමු පළාත ස්ථාපිත කිරීමෙන් පසු ප්‍රථම දිසාපති ධූරයත් හෙබ වූ හබර්ට් වේස් මහතාගේ සේවය සැමරීම සඳහා ය. ගොඩනැගිල්ල නිමර්ාණය කිරීම සඳහා මූලික වී කටයුතු කොට ඇත්තෙ හබර්ට් වේස් මහතාගෙන් පසුව දිසාපති ව සිටි ඩබ්ලිව්. එල්. ඩේවිඩ්සන් මහතා ය.

වෂර් 1857 සිට බුක් ක්ලබ් සංවිධානය මඟින් පවත්වාගෙන ආ පුස්තකාලය පැවති ස්ථානයේම අභිනව වේස් අනුස්මරණ ශාලාව ඉදිකිරීම වෂර් 1896 දී ආරම්භ කර ඇත. වෂර් 1887 දී ලෝකල් බෝඩ් පාලන ආයතනය ඇති කිරීමෙන් පසුව මෙහි කටයුතු ද එම පාලන ආයතනය මඟින් ගෙන ගොස් ඇත. අභිනව ගොඩනැගිල්ල “පුස්තකාලය හා නගර ශාලාව” (වර්තමාන නගර සභා කායර්ාලය නොවේ.) වශයෙන් වෂර් 1903 අප්‍රේල් 18 දින එවකට දිසාපති ධූරය දැරූ වී. ජැක්සන් මහතා විසින් විවෘත කොට ඇත.

මෙලෙස නිමර්ාණය වන පුස්තකාලය මහජන පුස්තකාලයක් වශයෙන් සංවධර්නය වී ඇත්තේ රත්නපුර “ලෝකල් බෝඩ්” නමැති පාලන ආයතනය නගර සභාවක් සහ මහා නගර සභාවක් වීමෙන් අනතුරුව ය. රත්නපුර මහා නගර සභාව මඟින් නව තෙමහල් මහජන පුස්තකාලයක් නිමර්ාණය කිරීම සඳහා වෂර් 1976 පෙබරවාරි මාසයේදී දිසාපති මැදුර අයත් භූමියේ මුල් ගල් තබා ඇත. මැණික් වෙළඳ ව්‍යාපාරික දානපතියෙකුගේ ආධාර මත එහි වැඩකටයුතු අඩක් නිමකළ අතර වෂර් 1982 දී මෙම ගොඩනැගිල්ල අධ්‍යාපන දෙපාතර්මේන්තුවට පවරාගෙන මිහිඳු විදුහල ආරම්භ කිරීම නිසා එම ගොඩනැගිල්ල අහිමිව ගොස් ඇත.

වෂර් 2012 ඔක්තොම්බර් මාසයේදී වේස් අනුස්මරණ ශාලාව රත්නපුර මහා නගර සභාව මඟින් ප්‍රතිසංස්කරණය කොට යළි විවෘත කොට ඇත. මෙම ප්‍රතිසංස්කරණ කාල සීමාව තුළ රත්නපුර මහජන පුස්තකාලය, පුළුඟුපිටිය වෛද්‍ය මධ්‍යස්ථානය සහ ගගබඩ සීවලි විද්‍යාලය යන ස්ථාන දෙකෙහි පවත්වාගෙන ගොස් ඇත. වතර්මානයේ පුස්තකාල ගොඩනැගිලි දෙකක් දක්වා වධර්නය වූ රත්නපුර මහජන පුස්තකාලය, ගරු නගරාධිපති ටිරෝන් අත්තනායක මැතිතුමන්ගේ ''කායර්ක්ෂම සේවාවක් තුළින් සෞභාග්‍යාමත් මිණිපුරයක්'' සංකල්පය තුළ පුස්තකාල කාරක සභාවේ ගරු සභාපති දුමින්ද කොස්වත්ත මැතිතුමන්ගේ මගපෙන්වීම ඔස්සේ පුස්තකාල ඉතිහාසයේ සංවධර්නාත්මක යුගයක් පසුකරමින් සිටියි.

**රත්නපුර මහ නගර සභා සීමාව තුළ පුස්තකාල සේවාවෙහි ව්‍යාප්තිය**

විමශර්න, බැහැරදෙන, ළමා සම කියවීම් ශාලා යන සේවාවන් ලබාදෙමින් පවත්වාගෙන ආ රත්නපුර මහජන පුස්තකාල සේවාව නාගරික කොට්ඨාශ පුරා ව්‍යාප්ත වීම ආරම්භ වන්නේ අසූව දශකයේ දී පමණ ය. ඒ ප්‍රාදේශීය කියවීම් ශාලා සහ ශාඛා පුස්තකාල නිමර්ාණය වීමත් සමගය. වෂර් 1983 දී මුද්දුව ශාඛා පුස්තකාලය නිමර්ාණය කිරීමෙන් ඇරඹෙන පුස්තකාල සේවාවේ ව්‍යාප්තිය අද වන විට ශාඛා පුස්තකාල 18ක් දක්වා සංවධර්නය වී ඇත.

| අනු අංකය | පුස්තකාලයේ නම | ආරම්භක වෂර්ය |
|---|---|---|
| 01 | ප්‍රධාන පුස්තකාලය | 1903 |
| 02 | බටුගෙදර | 1993 |
| 03 | අංගම්මන | 1993 |
| 04 | තිරිවනාකැටිය | 1993 |
| 05 | මුවගම | 1984 |
| 06 | මුද්දුව | 1983 |
| 07 | කොලින්ක්‍රසන්ට් | 2000 |
| 08 | කණාදොළ | 1997 |
| 09 | දේවාලයගාව | 1984 |
| 10 | නිදහස් සමරු ළමා පුස්තකාලය | 1999 |
| 11 | ගොළුවාවිල | 1994 |
| 12 | මහවල | 1987 |
| 12 | පොල්හේන්ගොඩ | 1990 |
| 13 | ගෝල්ඩන්ග්‍රෝ | 1987 |
| 14 | පොම්පකැලය | 1986 |
| 15 | පුබුදුගම | 1990 |
| 16 | කොස්පැලවින්න | 1987 |
| 17 | සමන්පෙදෙස | 1983 |
| 18 | සමගිපුර | 1986 |

වතර්මානය වන විට ලියාපදිංචි පුස්තකාල සාමාජිකයින් 12 සඳහා පුස්තකාල සේවාව සපයන රත්නපුර මහජන පුස්තකාලය, පුස්තකාල සාමාජිකත්වය ලබාගත නොහැකි නමුත් තොරතුරු සේවාවන් අවශ්‍ය පාඨකයින් වෙත පුස්තකාල සේවාවන් ලබාදීමට කටයුතු කරයි. පුස්තකාල සාමාජිකත්වය නොමැති වුවත් තොරතුරු පිපාසයෙන් පැමිණෙන විශ්වවිද්‍යාල විද්‍යාථර්ීන්, පයෙර්ෂකයින්, ගත් කතුවරුන් වැනි පුද්ගලයින් වෙනුවෙන් රත්නපුර මහජන පුස්තකාල දොරටුව නිරන්තරයෙන් විවෘත ව පවතී. තම ජාතික හැඳුනුම්පත හෝ විශ්වවිද්‍යාල හැඳුනුම්පත ඉදිරිපත් කොට විමශර්න අංශය පරිශීලනය කිරීමට අවස්ථාව ලබා දී ඇත.

**පුස්තකාල එකතු සංවර්ධනය සහ එකතු කළමනාකරණය**

පාඨකයින් වෙනුවෙන් සමතුලිත සහ ගුණාත්මක ග්‍රන්ථ එකතුවක් පුස්තකාලය තුළ ගොඩනංවා ඇත. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන තෙ භාෂාවෙන් ම පුස්තකාල එකතුව ස්වයංපෝෂිත කොට ඇත්තේ රත්නපුර මහ නගර සභා බල ප්‍රදේශය තුළ විවිධ ආගම්වලට අයත් විවිධ භාෂා කතා කරන පාඨක ප්‍රජාවක් ජීවත් වන බැවිනි. වන සමස්ත ග්‍රන්ථ එකතුව,

- බැහැරදෙන ග්‍රන්ථ එකතුව
- විමශර්න ග්‍රන්ථ එකතුව
- ළමා ග්‍රන්ථ එකතුව
- විශේෂ කෘති එකතුව
  - නීතිඥ වෝල්ටර් සිල්වා එකතුව
  - සබරගමු කෘති එකතුව
  - රත්නපුර කතෘවරුන්ගේ කෘති එකතුව
- පුවත්පත් ලිපි කැපුම් එකතුව
- මුද්දර කියවීම් එකතුව

යනාදී වශයෙන් සරලව ම වගර් කොට දැක්විය හැකිය. පුස්තකාල න්‍යායන් අනුගමනය කරමින් ඩිවි දශම වගර්කරණය අනුව විෂයන් වෙනුවෙන් සියලුම ග්‍රන්ථ වගර් කොට ඇති අතර පාඨකයින්ගේ පහසුව පිළිබඳ අවධානය යොමු කරමින් එම ග්‍රන්ථ සඳහා වණර් කේත ක්‍රමයක් ද හඳුන්වා දී ඇත.

| | | |
|---|---|---|
| පොදු කෘති | 000 | කොළ පැහැය |
| දශර්නය සහ මනෝ විද්‍යාව | 100 | තැඹිලි පැහැය |
| ආගම | 200 | ලා කහ පැහැය |
| සමාජයීය විද්‍යාවන් | 300 | ලා නිල් පැහැය |
| භාෂාව | 400 | ක්‍රීම් පැහැය |
| ස්වභාවික විද්‍යාවන් | 500 | ලා දුඹුරු පැහැය |
| තාක්ෂණය | 600 | රතු පැහැය |
| කලා ශිල්ප | 700 | කහ පැහැය |
| සාහිත්‍ය | 800 | රෝස පැහැය |

- නවකතා - ලා කොළ පැහැය
- පරිවතර්න - තද කොළ පැහැය
- නවකතා (දෙමළ) - ලා නිල් පැහැය

| | | |
|---|---|---|
| ඉතිහාසය සහ භූගෝල විද්‍යාව | 900 | නිල් පැහැය |

- ✔ සබරගමු කෘති එකතුව - දම් පැහැය
- ✔ නීති කෘති එකතුව - කළු පැහැය
- ✔ වෝල්ටර් සිල්වා කෘති එකතුව - තද නිල් පැහැය

**පුස්තකාල සාමාජිකත්වය ලබාගන්නා ආකාරය**

- වැඩිහිටි පුස්තකාල සමාජිකත්වය

රත්නපුර මහ නගර සභා සීමාව තුළ පදිංචි පුද්ගලයන්ට, මහ නගර සභා සීමාව තුළ රජයේ ආයතනයක ස්ථිර රැකියාවක නිරත පුද්ගලයන්ට සහ මහ නගර සභා සීමාව තුළ පිහිටි පාසලක ඉගෙනුම ලබන අවුරුදු 14ට වැඩි පාසල් සිසුන් සඳහා වැඩිහිටි පුස්තකාල සමාජිකත්වය ලබාගත හැකිය. සාමාජික අයදුම්පතෙහි ග්‍රාම නිලධාරී විසින් පදිංචිය සනාථ කිරීමත්, රැකියාවක් කරන්නේ නම් ආයතන ප්‍රධානියාගේ හෝ පාසලක ඉගෙනුම ලබන්නේ නම් පාසලේ විදුහල්පතිතුමාගේ නිදෙර්ශයත් අවශ්‍ය වේ. ඇපකරු වශයෙන් රත්නපුර මහ නගර සභාවට වරිපනම් ගෙවන පුද්ගලයෙකු හෝ රත්නපුර මහ නගර සභාවේ ගරු නාගරික මන්ත්‍රීවරයෙකු/වරියක ඇප විය යුතුය.

- ළමා පුස්තකාල සමාජිකත්වය

රත්නපුර මහ නගර සභා සීමාව තුළ පදිංචිය හිමි හෝ මහ නගර සභා සීමාව තුළ පිහිටි රජයේ පාසලක ඉගෙනුම ලබන අවුරුදු 14ට අඩු දරුවන් හට ළමා පුස්තකාල සාමාජිකත්වය ලබාදෙයි. ඉගෙනුම ලබන පාසලේ විදුහල්පතිතුමාගේ නිදෙර්ශය සහ ඇපකරු වශයෙන් දෙමාපියන්ගේ අත්සන තිබිය යුතුය.

**පුස්තකාලයෙහි ක්‍රියාත්මක අංශ**

- විමශර්න අංශය
- බැහැරදෙන අංශය
- ළමා අංශය
- අධ්‍යයන අංශය
- පුවත්පත් හා වාරසඟරා අංශය
- මුද්දර කියවීම් ඒකකය (ශ්‍රී ලංකාවේ පළමු සහ රත්නපුර දිස්ත්‍රික්කයේ එකම)
- පොත් බැදුම් අංශය

**පුස්තකාලය මගින් ඔබට ලබාදෙන සේවාවන්**

- ➢ බැහැරදෙන සේවා

රත්නපුර මහ නගර සභා සීමාව තුළ පදිංචි පුද්ගලයන්ට, මහ නගර සභා සීමාව තුළ රජයේ ආයතනයක ස්ථිර රැකියාවක නිරත පුද්ගලයන්ට සහ මහ නගර සභා සීමාව තුළ පිහිටි පාසලක ඉගෙනුම ලබන පාසල් සිසුන් හට බැහැරදෙන සේවා ලබාදෙයි. එක් සාමාජිකයෙකු හට සාමාජික අයදුම්පත් දෙකක් නිකුත් කරන අතර පොත් දෙකක් දින 14ක කාලයක් සඳහා බැහැර දෙනු ලබයි. දින 14න් පසු පොත් නැවත භාරදෙන දිනය දීඝර් කරගැනීමට අවස්ථාව ඇති අතර නියමිත දිනයේ භාරනොදෙන පොත් සඳහා ප්‍රමාද ගාස්තු අය කරනු ලබයි.

- ➢ විමශර්න සේවා

පුස්තකාල සමාජිකත්වය ලබාගත් ඕනෑම සාමාජිකයෙකුට විමශර්න අංශය පරිහරණය කිරීමේ අවස්ථාව ලබාදෙන නමුත් විමශර්න ග්‍රන්ථ බැහැර දීමක් සිදු නොකරයි. පුස්තකාල සාමාජිකත්වය ලබා නොගත් පුද්ගලයන් හට ද තම ජාතික හැඳුනුම්පත හෝ විශ්වවිද්‍යාල හැඳුනුම්පත හෝ ඉදිරිපත් කොට විමශර්න අංශය පරිහරණය කිරීමේ අවස්ථාව ලබදෙනු ලබයි.

- ➢ අධ්‍යයන සේවා

පෙ.ව. 8.00 සිට ප.ව. 5.00 දක්වා පුස්තකාල අධ්‍යයන අංශය තුළ අධ්‍යයන කටයුතුවල නිරත වීමට අවස්ථාව ලබාදෙනු ලබයි.

- පුවත්පත් කියවීම් සේවා

ත්‍රෛ භාෂාවෙන් ප්‍රකාශයට පත් කරන දිනපතා, සතිඅන්ත සහ මාසික පුවත්පත් කියවීමේ අවස්ථාව ලබාදෙනු ලබයි.

සිංහල - දිනමිණ, දිවයින, ලංකාදීප, මව්බිම, අද, විජය, මිහිර, නවලිය, තරුණී, සිරිකත, බුදුසරණ, සරසවිය, විදුසර, සුබසෙත, රාවය, දේශය, අරුණ

ඉංග්‍රීසි - ඩේලි නිවුස්, ඩේලි මිරර්, ද අයිලන්ඩ්, ඔබ්සවර්

දෙමළ - වීරකේසරී, තිනකරන්

- පුවත්පත් කැපුම් සේවා

විවිධ මාතෘකා යටතේ පුවත්පත්වල පළ වූ ලිපි කපා එකතු කොට ලිපිගොනු 120ක් පමණ පවත්වාගෙන යනු ලබයි.

උදා - රත්නපුර මහ නගර සභාව සම්බන්ධ ලිපි, මැතිවරණ ප්‍රතිඵල, කාන්තා හා ළමා අපචාර, පරිගණක, රාවණා, පරිසරය, අයවැය

- වාරසගරා සේවා

සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශයට පත් වන වාරසගරා කියවීමේ අවස්ථාව ලබාදෙනු ලබයි.

සිංහල - සමබිම, ගුරු තරුව, ප්‍රබෝධය, පරිසර පුවත්, පරිගණක

ඉංග්‍රීසි - ටයිම්ස්

- වෘත්තීය මාගෙර්ාපදේශ සේවා

පුස්තකාල දැන්වීම් පුවරුව, මුහුණු පොත සහ වෙබ් අඩවිය මගින් නවතම රැකියා අවස්ථා සහ වෘත්තිය පළපුරුද්ද ලබාගත හැකි අවස්ථා පිළිබඳ දැනුවත් කිරීම සිදුකරයි.

- ජංගම පුස්තකාල සේවා

පුස්තකාලයට පැමිණීමට නොහැකි පුද්ගලයන්, ආයතන වෙත ජංගම සේවා ලබාදෙනු ලබයි.

උදා- සී/සමරතුංග වැඩිහිටි නිවාසය

- අන්තර් පුස්තකාල පිරුළු සේවා

පාඨකයෙකුට අවශ්‍ය ග්‍රන්ථයක් අප පුස්තකාලයෙහි නොමැති අවස්ථාවක වෙනත් පුස්තකාලයකින් සති දෙකක කාලයක් සඳහා ණයට ලබාගෙන පාඨක පරිහරණය සඳහා ලබාදෙනු ලබයි.

- නිදහස් කියවීම් සේවා

පුස්තකාලයේ බාහිර පරිශ්‍රය තුළ නිදහස් කියවීම්, කණ්ඩායම් අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සපයා ඇත.

- යොමුගත සේවා

තොරතුරු සොයා පැමිණෙන පාඨකයින් අවශ්‍ය තොරතුර තිබෙන පුස්තකාලය, තොරතුරු මධ්‍යස්ථානය, ආයතනය වෙත හෝ තොරතුරු ලබාගත හැකි පුද්ගලයන් වෙත හෝ යොමු කිරීම සිදු කරනු ලබයි.

අද වන විට මහජන පුස්තකාලයක් විසින් තම පාඨකයින් වෙත ලබාදෙන මූලික පුස්තකාල සේවාවන්ගෙන් ඔබ්බට යමින් නව සන්නිවේදන තාක්ෂණය ද භාවිත කරමින් පාඨකයින් වෙත ලබාදෙන සේවාවන් පුළුල් කොට ඇත. ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් කොට පුස්තකාල ස්වයංක්‍රියකරණ දත්ත පද්ධතියක් සකස් කිරීමේ මූලික කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර E-Library සංකල්පය යථාර්ථයක් කරවීම වෙනුවෙන් පුස්තකාලය සඳහා වෙබ් අඩවියක් නිමර්ාණය කිරීමේ නයමු ව්‍යාපෘතිය මේ වන විටත් අවසන් නොට ඇත.

කොවිඩ් ඇදිරිනීතිය පැවති කාල සීමාව තුළ අප පුස්තකාල මුහුණුපොත ඔස්සේ පාඨකයින් වෙත සමීප විය.

පාඨකයින් වෙනුවෙන් මාගර්ගත තරග, වැඩසටහන් පැවැත්වීම

- ලෝක ළමා දිනය වෙනුවෙන් "ප්‍රහේලිකා පුරවමු - තෑගි දිනමු"
- “I can and I win” English Essay Reading Competition
- English Nursery Rhyme/Poem Competition
- නවකතා පාදක ටෙලි නිමර්ාණ හඳුනාගැනීම වෙනුවෙන් "නවකතාවෙන් ටෙලිකතාවට"
- ලෝක වැඩිහිටි හා ළමා දිනය වෙනුවෙන් "පුංචි පැළේ ලොකුවෙනා" පැළ සිටුවීමේ වැඩසටහන

පාඨකයින්ගේ නිමර්ාණාත්මක කුසලතා සඳහා සහිබර් අවකාශයේ ඉඩක් ලබාදීම

- පොසොන් පොහොය වෙනුවෙන් "පොසොන් සදයි - සාහිත ගගුලයි"
- ඡායාරූප සඳහා පද්‍ය නිමර්ාණ කිරීම වෙනුවෙන් "නිකිණි හදයි - හද සිතුවිල්ලයි"
- ලෝක ගුරු දිනය වෙනුවෙන් "පුංචි අපේ සිතුවම් දැක්ම" මාගර්ගත සිතුවම් දැක්ම

සබරගමුවට සුවිශේෂීව ඉතිහාසගත තොරතුරු සමුද්ධරණය

- දන්න රත්නපුරේ ඔබ නොදත් කතා
- ඇසළ මහ කාතරීය හෙවත් සමන් දෙවි කෙළි මාසය
- කළු ගග නිසල ව ගලාබසී

කොවිඩ් නව සාමාන්‍යකරණය තුළ දී මුද්දර කියවීම් ඒකකය හරහා විවිධ සමාජ සේවා වැඩසටහන් ද සිදු කිරීමට අපට හැකියාව විය. "ලිපියක් ලියන්න - සිනහවක් ගෙන එන්න වැඩසටහන" නමින් සමාජයේ විවිධ පුද්ගලයින් වෙත දිරි ගැන්වීමේ අදහස් සහ සුභාෂිංශන සටහන් ඇතුළත් තැපැල්පත් බෙදාදීම සහ තැපැල් කිරීම සිදු කරන ලදී. ඒ අනුව,

- ලෝක සෞඛ්‍ය දිනය වෙනුවෙන් රත්නපුර ශික්ෂණ රෝහල් කායර් මණ්ඩලය වෙත
- කොවිඩ් රෝග රාජකාරි වෙනුවෙන් වෙහෙසුණු රත්නපුර මහ නගර සභා සෞඛ්‍ය කායර් මණ්ඩලය වෙත
- ලෝක වැඩිහිටි දිනය වෙනුවෙන් සී/සමරතුංග වැඩිහිටි නිවාසයේ වැඩිහිටසයන් වෙනුවෙන්
- ලෝක ළමා දිනය වෙනුවෙන් ගැටන්ගම අපේ ගෙදර ළමා නිවාසයේ දරුවන් වෙනුවෙන්

**ඔබට අප හා සම්බන්ධ වීමට අවශ්‍ය නම්,**

දු.ක - 045 2222957

විද්‍යුත් ලිපිනය - publiclibraryrathnapura@gmail.com

ලිපිනය - මහජන පුස්තකාලය, මහා නගර සභාව, රත්නපුර

FB - රත්නපුර මහජන පුස්තකාලය

සුප්‍රසිද්ධ ගත් කතුවරයෙකු වන මැක්සිම් ගෝකී, "මම පොත්වලට ආදරය කරන්නෙමි. හැම පොතක් ම මට පෙනෙන්නේ හාස්කමක් හැටියට ය. ගැඹුරු හැඟීම්වලින් සහ ප්‍රීතිමත් උද්‍යෝගයකින් යුතුව මිස මට පොතක් ගැන කතා කළ නොහැකි ය" යනුවෙන් පොත් කියවීම සම්බන්ධයෙන් කළ සඳහන තුළින් පොතපත කියවීමේ ප්‍රභශර්ය කෙතරම් ද යන්න ඔබට වටහාගත හැකිය.පොතපත නොකියවන ප්‍රජාවක් අං තට්ටුවක් සහ වලිගයක් නොමැති ව අයාලේ යන ගවයන් රැළකට විද්වත්හු සමාන කරති. එලෙස අයාලේ යන ගවයෙක් වනවා ද නොවනවා ද යන්න තීරණය කිරීම ඔබට භාර කරමින් රුවන්පුර රුවන්ගෙයි දොරටුව අප ඔබට විවෘත කර තබමු.